# ලෝකාලෝකය

2016 දෙසැම්බර් 2017 ජනවාරි කලාපය

## අපි දිනපතා බයිබලය කියවමු




**දෙවියන්වහන්සේ පුත්‍රයාණන් ලෝකයට එව්වේ ලෝකයා විනිශ්චය කරන පිණිස නොව ලෝකයා උන්වහන්සේ කරණ කොටගෙන ගලවනු ලබන පිණිසය.**

**(යොහාන් 3:17)**


ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය

අංක - 07, විවේකානන්ද පාර, වැල්ලවත්ත, කොළඹ 06.

දුරකථන අංක : 011 2581901

ළමා පිටුව

# අලුත් වෙනසක්

ආදරණීය දුවේ පුතේ ඔන්න ආයෙමත් ඔයාලා ආසම කරන ඔයාලට ගොඩක් සතුටු වෙන්න පුළුවන් කාලය ලං වෙලා. මොකද දන්නවාද, අපි හැමෝම ආසයිනේ නත්තල සමරන්න. මේ නිවාඩු කාලයේදී තමයි අපට පාසල් වල දිගම නිවාඩු ලැබෙන්නෙත්. අපි ආස කරන තෑගි බෝග, රස කෑම ජාති, ලස්සන ලස්සන ඇඳුම් පැළඳුම් හැම දෙයක්ම ලැබෙන්නේ මේ කාලයටයි.

ඉතින් දුවේ පුතේ, මේ කථාව කියවලා බලලා මේ නත්තලේ දෙවියන්වහන්සේ අපෙන් බලාපොරොත්තු වන දේ ගැන සිතමු.

එක දුප්පත් ගෙදරක ජිවත් වුණා කමලා කියා පොඩි ගැහැණු ළමයෙක්. ඇය ඉගෙනිමට බොහෝම දක්ෂයි, ඒ උනත් ඇයට වුවමනා තරමට ඇඳුම් පැළඳුම්, පාසල් උපකරණ ඇයට තිබුණේ නැහැ. ඇගේ දෙමව්පියන්ට ඒවා සපුරාලන්නට හැකියාවක් තිබුනෙත් නැහැ. ඒත් මේ පුංචි කමලා මේ කිසි දෙයකින් අධෛර්‍යමත් වුණේ නැහැ. ඇය බොහෝම උනන්දුවෙන් ඇගේ ඉගෙනිම් කටයුතු කරගෙන ගියා. හැම විටකම ඇයට ළඟින්ම සිටියා හොඳ මිතුරියක්. ඇය තමා නෙත්මි.

නෙත්මි දෙවියන්වහන්සේට ලං වෙලා හිටපු ඉතා හොඳ දරුවෙක්, ඇය හැම මොහොතකම ඇයට පුළුවන් අයුරින් කමලාට උපකාර කරා ඒ අතරම දෙවියන්වහන්සේ ඇයට දක්වන ආදරය, කරුණාව ගැන කමලාට කියලා දුන්නා. මේ නිසාම පුංචි කමලගේ හදවතත් දෙවියන්වහන්සේගේ ප්‍රේමය දැකගන්න ආස කරා. ඇය දැක්කා නෙත්මිගේ ජිවිතය තුළ තිබුණු වෙනස. කමලා දුටුවා නෙත්මි තුලින් යේසුස්වහන්සේ තුළ තිබුණු ගුණාංග.

ඒ කියන්නේ එතුමා තුළ තිබුණු ප්‍රේමය, ඉවසිම, සමාව දිමේ ගතිය, මෘදු ගතිය, කරුණාව වගේ ගුණාංග ටික කලකින් පසුව කමලා දෙවියන්වහන්සේව අදහා ගත්තා.

ඉතින් දුවේ පුතේ පුංචි ඔයාලත් මේ ගුණාංග ඔයාලගේ ජිවිත වලින් අන් අයට පෙන්වන්නට උත්සහ කරන්න.

මේ නත්තලේ දෙවියන්වහන්සේ ඔයාලගෙන් බලාපොරොත්තු වන්නේ එයයි. පුංචි ඔයාලගේ ජිවිත වලින් පෙනෙන යේසුස්වහන්සේගේ ගුණාංග අනිත් ළමයින්ටත් බෙදිලා යන්න ඕනෑ. එවිට ඒ අය යේසුස්වහන්සේව අදහා ගෙන තවත් අයගේ ජිවිත වලට ආලෝකයක් වේවි.

පුංචි ඔයාලා හැමෝටම යේසු පිහිටයි.



# ඔහු තැළුණු බටලීයක් නොබිඳින්නේය, දුම්ගහන පහන් තිරයක් නොනිවන්නේය. (යෙසායා 42:3)

අපගේ ගැළවුම්කාර ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් ඔබ සැමට ආචාර කරමි. 2017 වසර ඔබ සැමට දෙවියන්වහන්සේගේ ප්‍රේමයත්, ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාවත්, ශුද්ධාත්මයාණන් වහන්සේගේ සැනසිල්ලත් නිරන්තරයෙන්, අධික වේවා.

2016 වසර පිළිබඳ අපගේ පියවූ දෙවියන්වහන්සේට ස්තුති වේවා. ගෙවීගිය වසර තුල අප සමඟ නිරන්තරයෙන් වැඩ සිටිමින් මඟපෙන්වා සපයා දී, සුවකර, ශක්තිමත් කර, අපට ආශිර්වාද කළාවූ අපගේ මැවුම්කාරුවාණන් වූ එකම දෙවියන්වහන්සේට නමස්කාර වේවා !.

ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උත්පත්තියට වසර බොහෝ ගණනකට පෙර උන්වහන්සේ ගැන ලියවුණු අනාගත වාක්‍යයන් ඉහත සඳහන් වෙයි. එහි උන්වහන්සේගේ චරිතය හා ජිවිතය කෙබඳු ආකාර වන්නේද පිළිබඳ සඳහන් වේ. යොහාන් 1:17 හි මෙසේ සඳහන් වේ. "ව්‍යවස්ථාව මොසෙස් කරණකොටගෙන පැමිණියත් අනුග්‍රහය හා සත්‍ය පැමිනියේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙනය". එනම් මනුෂ්‍යයා වරදට පත් කිරීමේ සේවය ව්‍යවස්ථාව කරණකොටගෙන සිදුවන අතර මනුෂ්‍යයාට සමාව දීම හා මුදා හැරීම සිදුවන්නේ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරණකොටගෙනය. පාපකාරී මනුෂ්‍යයා කෙරෙහි දයාණුකම්පාවෙන් ක්‍රියා කිරීමට අවශ්‍ය අනුග්‍රහය උන්වහන්සේ සතු විය. වරදට පත් නොකර පව්කාරයන්ව පිළි ගැනිමට උන්වහන්සේට හැකියාව තිබුණි. ශුභාරංචි පොත් කියවීමේදී උන්වහන්සේ වෙත පැමිණි හෝ ගෙනෙන ලද ස්ත්‍රීන් පුරුෂයන්, ගේ ජිවිත දෙස සිතා බලන්න. ඔවුන් උන්වහන්සේ මුණ ගැසිමට පෙර ජිවිතය හා උන්වහන්සේ මුණගැසිමෙන් පසු ඔවුන්ගේ ජිවිත දෙස බැලිමේ ඒ බව හොඳින් වටහා ගැනිමට හැක.

තැළුණු බටලිය හා දුන් දමන පහන් තිර අපට කියා පාන්නේ කිසිම වැදගම්මකට නැති හෝ නිශ් ප්‍රයෝජන බාවය පිළිබඳවයි. මෙහිදී මේ දෙකෙන්ම කතා කරන්නේ පව්කාර මනුෂ්‍යයන් ගැනය. පාපය අන්තයටම ගොස් බලාපොරොත්තුවක් පවා තබා ගත නොහැකි ඉතාම කාලකණ්නි තත්වයක සිටින අන්ත පව්කාරයන්ය. පහන්තිර දුන් දමන විට අප එය නිවා දමයි. නමුත් යේසුස්වහන්සේ එයට තෙල් වත් කොට නැවත දල්වයි. ඒ ආකාරයෙන් සමාජය ප්‍රතික්ෂේප කරන අය යේසුස්වහන්සේ විසින් පිළිගෙන සනසා ඔවුන්ට නව උත්පාදනය ලබා දී ඔවුන් අළුත් මනුෂ්‍යයන් ස්ත්‍රීන් බවට පත් කරයි. උදාහරණ ලෙස සමාරියේ ස්ත්‍රිය, කාම මිත්‍යාචාරික ස්ත්‍රිය, උන්වහන්සේ

සමග ඇණ ගසන සොරා ඇතුළු තවත් බොහෝ ජිවිත හා එදා මෙදා තුර උන්වහන්සේගේ අනුග්‍රහය අත් දැක්කාවූ ලක්‍ෂ ගණන් මනුෂ්‍යයන් අපට සාක්‍ෂි දරණවා ඇත. ප්‍රිය සහෝදර සහෝදරියණි, ..... ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අනුග්‍රහය කරණ කොට රසබලා දැනගන්න. එමෙන්ම උන්වහන්සේ තුල තිබුණා වූ සිතම ඔබ තුලත් ඇති කර ගන්න.

දෙවියන්වහන්සේ බලන්නාක්මෙන් ඔබත් මාත් බැලිමමට ඉගෙන ගත්තොත් ඔබේ ජිවිතයත්, මගේ ජිවිතයත්, මහත් විපර්යාසයකට භාජනය වෙනවා නියතයි.

ඔබත් මාත් පාපයෙන් ගලවා දේව දරුවෙකු බවට පත් කිරීමටත්, මෙලොවද අළුත් ජිවිතයක් ලබා දීමටත්, සදා කාලයට උන්වහන්සේගේ දේව රාජ්‍යයේ පංගුකාරකම ලබා දීමටත් ස්වාමිවූ යේසුස්වහන්සේ අප උදෙසා මහත් දේ කළ සේක.

## 01. ක්‍රිස්තුස්වහන්සේ අප උදෙසා සාපයක් වී, ව්‍යවස්ථාවේ සාපයෙන් අප මුදාගත් සේක. (ගලාති 3:13)

ව්‍යවස්ථාවෙන් කරනු ලබන්නේ පාපය පාපය ලෙස හඳුන්වා දීමයි. එනම් පව්කරන මනුෂ්‍යයා වරද කාරයෙකු බවට ඔප්පු කිරීමයි. වරදකාරයෙකු බවට පත් විමෙන් දඬුවම නියම වේ. මනුෂ්‍යයාට මෙය මහත් සාපයක් වී තිබුණි. - වැරැද්දක් කර පසු එයින් මිදීමක් නොතිබුනි. නමුත් යේසුස්වහන්සේ අපගේ වරද, පාපය, උන්වහන්සේ පිට දරාගෙන කුරිසි ගසේ අප උදෙසා ජිවිතය දී පාපයේ දඬුවමින් අපව මුදා ගත් සේක. - ..........

## 02. ක්‍රිස්තුස්වහන්සේ මාංශයෙන් අප උදෙසා, වද වින්ද බැවින් මාංශයේ ඉතිරිව තිබෙන කාලයෙහි තවත් මනුෂ්‍යයන්ගේ තෘෂ්ණා ලෙස නොව ..... 1 පේත්‍රැස් 4:1

අපගේ මාංශයේ තෘෂ්ණා නසන පිණිස යේසුස්වහන්සේ මාංශයෙන් එනම් ශරීරයෙන් වධවින්ධ බව බයිබලය අපට පවසයි. මෙය විශ්වාස කරන විට මාංශික තෘෂ්ණා වලින් අපට ජය ගත හැක. ලොව මෙතෙක් තිබුණු වඩාත් කෘරතම දඬුවම් ලබා දුන්නේ රෝම නිතියයි. උන්වහන්සේ මහා දරුණු රෝම සොල්දාදුවන්ගේ කස පහර හා අතුල් පහර, පොලු පහර, වේවැල් පහර, කටු ඔටුණු හා ඇණ පහර උන්වහන්සේගේ ශුද්ධ ශරීරයට වද දුන්නේය. උන්වහන්සේද අප උදෙසා සියල්ල දරාගත් සේක. එයින් අද අපට මාංශික තෘෂ්ණා පාලනය කිරීමටත් ඒවා ජය ගැනිමටත් ඇදහිල්ල කරුණකොට ගෙන අපගේ මාංශය (ශරීරය) තුල උන්වහන්සේගේ බලය ක්‍රියාත්මක වෙයි. - ක්‍රිස්තුස්වහන්සේ අප උදෙසා ශරීරයෙන් වද වින්ද සේක. - ආමෙන්.

## 03. අප අවධිව සිටිතත්, නිදා ගනිතත්, තමන්වහන්සේ සමග එක්ව ජිවත් වන පිණිස ක්‍රිස්තුස්වහන්සේ අප උදෙසා මළ සේක. (1 තේසලෝනික 5:10)

1 යොහාන් 3:16 උන්වහන්සේ අප උදෙසා ප්‍රාණය දුන්සේක යැයි පවසයි. අප සමඟ එකට ජිවත් වන පිණිස යේසුස්වහන්සේ අප උදෙසා මැරුණු බව තෙසලෝනික පොතේ සඳහන්

වේ. මෙහි උන්වහන්සේගේ අප කෙරෙහි ඇත්තා වූ ප්‍රේමය හා සදාකාලික සැළසුම එළිදරව් කරයි. එනම් "එක්ව ජිවත් වන පිණිස" මෙයයි උන්වහන්සේගේ ආශාව අප සමඟ අප මධ්‍යයෙහි, අප තුළ, වාසය කිරීමයි. ඒ උදෙසා තම ප්‍රාණය දුන් සේක. අප උදෙසා උන්වහන්සේ මළ සේක - ආමෙන්.

**04. උන්වහන්සේ සියළු අධෛර්‍යම්ෂ්ඨ කම් වලින් අප මුදා යහපත් ක්‍රියා ගැන ජවලිත වූ සෙනගක් ස්වකීය සම්පතක් කොට පවිත්‍ර කර ගන්නා පිණිස, අප උදෙසා තමන්ම දුන් සේක. (තීතස් 2:14)**

මෙහි උන්වහන්සේ තමන්ම දුන්සේක යැයි පවසයි. එහි අර්ථය නම් කුරුසියේ මරණය පමණක් නොව සදාකාල අතිතයේදි ස්වර්ගයේ සිටි යේසුස්වහන්සේ පොළොවට පැමිණීමට ගත් තිරණයක්යේ සිට, (යෙසායා 6:8) මළවුන්ගෙන් නැගිට ස්වර්ගයේ දෙවියන්වහන්සේගේ සිංහාසනයේ දකුණු පැත්තෙහි වාඩි විම දක්වාද (ක්‍රියා 7:56) සදාකාලයෙන් සදාකාලයට දක්වාම උන්වහන්සේගේ මුළු ක්‍රියාව "තමන්ම දුන් සේක" යන්නෙහි අර්ථයයි. අන්ත පව්කාරයන් වන අපට එයින් මහත් සදාකාලික කියා නිම කළ නොහැකි ශ්‍රේෂ්ඨ ගැළවිම ලැබුණි - ආමෙන්.

**05. මැරෙතත් ඒ ඇර මළවුන්ගෙන් නැගිටුවනු ලැබුවෙත් දෙවියන්වහන් සේගේ දකුණු පැත්තේ සිට අප උදෙසා මැදහත්කාර කම් කරන්නෙත් ක්‍රිස්තුස්වහන්සේය. (රෝම 8:34)**

උදයෙන් උදය උන්වහන්සේගේ කරුණාව අළුත්වන බව ගිතාවලිය පොතෙහි සදහන් වේ. එම සත්‍යයම 93:3 හි, උදය ඔබගේ කරුණා ගුණයත් රාත්‍රිය ඔබගේ විශ්වාස කමත් අත්දකින බව පවසයි. එනම් දවසේ ආරම්භය උන්වහන්සේගේ කරුණාව කෙරෙහි ඇදහිල්ලෙන් හා දවසේ අවසානය එම දවස දෙස හැරී බලා උන්වහන්සේ විශ්වාසවන්ත භාවය පිළිබඳව ප්‍රසංගා කිරීමත්ය. එනම් මුළු දවස පුරා උන්වහන්සේ අප සමඟ සිට ඇත. එනම් සැම මොහොතකම ක්‍රිස්තුස්වහන්සේ අප උදෙසා මැදහත්කාරකම් කරන සේක. දුක - සැප , අග - හිඟ, නින්දා, ප්‍රසංගා, තනිකම, අසනිප, සතුට දෙම්නස, වේදනා, ප්‍රිතිය මේ හැම අත්දැකිමක් තුලම අපේ ස්වාමීන්වහන්සේ අප සමඟය. නිරන්තරයෙන් උන්වහන්සේ අප උදෙසා මැදහත්කාර කම් කරන සේක.- ආමෙන්.

ප්‍රිය සහෝදර සහෝදරයෙනි නිරන්තරයෙන්ම ඔබත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ සිතන්න. උන්වහන්සේ ගැන අන් අයට පවසන්න. දිනපතා බයිබලය කියවන්න. යාච්ඤා කරන්න, උන්වහන්සේ තුල නිතරම ප්‍රිතිමත් වන්න, සැම විටම උන්වහන්සේව විශ්වාස කරන්න. ඔබ සැමට ආශිර්වාදමත් නව වසරක් වේවායි ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ප්‍රාර්ථනා කරමි.

**සංස්කාරක.**
**එස්. මෙත්තානන්ද**
**077 8 813 197**

බයිබලයේ සතුන්

# සර්පයා

ශුද්ධ ලියවිල්ලේ සර්පයා ගැන සඳහන් වන්නේ වරක් දෙවරක් නොවේ. කොතරම් දරුණු සර්පයන් අප අතර සිටියත් සියල්ලට වඩා දරුණු සර්පයා ගැන ශුද්ධ බයිබලය මුලින්ම කථා කරන්නේ උත්පත්ති 3:1 හිදිය. "සර්පයා වනාහි ස්වාමිවූ දෙවියන්වහන්සේ සෑදූ වනයේ කවර සත්වයෙකුටත් වඩා ප්‍රයෝග සහිත වූයේය"යි දේව වචනය අපට සර්පයා ගැන විස්තර කර දෙයි. කිසිවෙකුට දෂ්ඨ කළ වහාම සර්පයා ඈත් මෑත්ව සැගවෙන බව අපි දනිමු. ලෝකය පටන්ගැන්මේදී මිහිපිට ස්වර්ගයක් වූ නමුත් එහි පාපයේ බීජය රෝපනය කිරීමේ අගෞරවනිය වාර්තාව තැබූ වේ සාතන් හෙවත් සර්පයායි. දෙවියන්වහන්සේ පිළිබඳව ඒතාක් කිසිදු සැකයක් , ප්‍රශ්ණයක් තිබුනේ නැත. එහෙත් සර්පයෙකු ලෙස ඒදන් උයනට පැමිණ සැකයේ බීජය ඒවගේ සිතට ඇතුලත් කිරීමේ ප්‍රතිඵලය වූයේ සෑම සිතකම ඇදහිල්ලේ ජයග්‍රහනය මැරී සැකයේ පරාජිතභාවය උරුම වීමයි. කාන්තාර ගමනේදී හෝර් කන්දේ සිට ගමන් කරන අතර සෙනඟගේ බොහෝ සිත් අධෛර්යට පත්ව දෙවියන්වහන්සේට හා මෝසෙස්ට විරුද්ධව ඔහුන් තදින් කෙඳුරූ අවස්ථාව ගණන් කථාව 21:4-5, අපට කියවීමට පුළුවන.

## ගිණි සර්පයන්

"ස්වාමීන්වහන්සේ සෙනඟ අතරට ගිණි සර්පයන් යැවූසේක. උන් සෙනඟට දෂ්ඨ කළෝය. "එසේ ඊශ්‍රායෙල් වරුන්ගෙන් බොහෝ දෙනෙක් මළෝය. මෙම අවස්ථාවේදී සෙනඟගේ සිත් වරද පිළිබඳව පසු තැවිල්ලට හැරුණු බැවින් ස්වාමී වූ දෙවියන්වහන්සේ අනුකම්පා කළ සේක. මෝසෙස් ගිණි සර්පයන් උදෙසා යාච්ඤා කළේය. "නුඹ පිත්තල සර්පයෙකු සාදා ඒක කුඹ ගසක් පිට තබාපන්න. දෂ්ඨ කරනු ලැබූ කවරෙකු නමුත් ඒ දෙස බලා ජිවත් වන්නේයයි මෝසෙස්ට ස්වාමීන්වහන්සේ කිසේක. මෝසෙස් පිත්තල සර්පයෙකු සාදා ඒක තුඹසක් පිට තැබිය. තවද යමෙක් සර්පයෙකු විසින් දෂ්ඨ කරනු ලද්දේ නම් ඔහු පිත්තල සර්පයා දෙස බැලූ කල් හි ජිවත් විය. "(ගණන කථාව 21:8-9) අපගේ සිත් පාපයේ සර්පයා විසින් දෂ්ඨ කර ආත්මය විනාශ කරනු ලැබ සිටියෙමු, නොවේද? පාපයේ ජිවත් වන (නැවත උත්පාදය නොලැබූ) සෑම දෙනාම පාපයේ සර්පයා විසින් දෂ්ඨ

කරනු ලැබ සිටිති. එබඳු වුවත් සඳහා කුරුසියෙහි ඔසවනු ලැබූ ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සිටින සේක. උන්වහන්සේගේ පාප කමාව දෙස ඇදහිල්ලෙන් බලන සියල්ලන්ට සදාකාල ජිවනය ලැබෙන බව අපි දනිමුව. මෙම විජයග්‍රාහි අද්දැකිම ඔබ ලබා තිබේද? ප්‍රිය මිතුර මිතුරිය, යොහාන් 3:14 ඔබට යලි මතක් කිරීමට මට ඉඩ හරින්න. "මොසෙස් කාන්තාරයේදී සර්පයා එසවූ ලෙසම මනුෂ්‍ය පුත්‍රයාද උන්වහන්සේ කෙරෙහි අදහා ගන්න සැම දෙනම සදාකාල ජිවනය ලබන පිණිස ඔසවනු ලබන්ට ඕනෑය"යි යේසුස්වහන්සේම කි සේක.

## සර්පයා පරාජිතයි

සර්පයාගේ දළ විෂ සහිත වුවත් (යක්ෂයාගේ ක්‍රියා බිහිසුනු වුවත්) ස්වාමීවූ යේසුස්වහන්සේ කෙරෙහි අදහනවුන්ට ලැබී තිබෙන බලය එයට වඩා ඉතා බලවත්ය. වරක් තේ වතුකරයේ මම තවත් ඇදහිලිවතෙකු සමඟ දේව සේවයක යෙදී සිටින අතර සවස 6.30 සිට රාත්‍රි 11.00 පමණ දක්වා ලැයිම් පේළිවල ශුභාරංචිය දේශනා කෙළෙමි. ලැයිම් පේළියෙන් පේළියට අප සමඟ ගමන් කළ රාජා නම් දෙමළ සහෝදරයෙකුට සර්පයෙකු දෂ්ට කළේ මේ අතරේදීය. වේලාවද රාත්‍රි 11.00 පසුවී තිබුණි. රෝහලකට හෝ වෙද හලකට යා යුතු දුරද ගමනාගමන අපහසුවද බලවත් විය. බොහෝ දෙනෙකු දෙවියන්වහන්සේටත් අපටත් පරිභව කළහ. ස්වාමීන්වහන්සේ අපේ සිත් ධෛර්‍යමත් කළ සේක. රාජා ක්ලාන්තව අඩපණ විය. අපි කඳුලින් ස්වාමීන්වහන්සේට යාච්ඤා කළෙමු. **"සර්පයන්ද ගොනුස්සන්ද පාගන්ටත් සතුරාගේ මුළු ශක්තිය මැඩ පවත්වන්නටත් මා විසින් නුඹලාට බලය දී තිබේ. කොයි දේකින් වත් නුඹලාට අනුතරායක් නොවන්නේය."** (ලූක් 10:19) මෙම පොරොන්දුව අපි තරයේ අල්ලා ගතිමු. නිසන්සලව දරුඳඩුව සිටි රාජා පිබිදිණි. විෂ බැස ගියේය. ඔහු පසුදා තේවත්තේ වැඩට ගිය බව එම ප්‍රදේශයේ ඇදහිලිවතුන් අදත් සාක්ෂි දරති. "ඔහු මාගේ නාමයෙන්..... සර්පයින් අල්ලා ගන්නෝය"යි මාර්ක් 16:17 කිවේ අන් කිසිවෙකු නොව යේසුස්වහන්සේය.

## බිහිසුනු සර්පයෙක්

"රතු ඇස් ඇත්තේ කාටද? මුද්‍රික පානය (හැලි අරක්කු, රා,

මත්ද්‍රව්‍ය) ලඟ පමාවෙන්නන්ටය. මිශ්‍ර කළ බීම සොයා යන්නන්ටය. එය රතුව පෙනෙන විටත් පාත්‍රයෙහි දිලිසෙන විටත්, සිනිඳු ලෙස වැක්කෙරෙන විටත් ඒ දෙස නොබලන්න. අන්තිමේදී එය සර්පයෙකු මෙන් සපා කා පොළඟෙකු මෙන් දෂ්ඨ කරයි." (හිතෝපදේශ 23:30,31,32 පද) වත්මන් සමාජයේ සිත් දූෂනය කරන බිහිසුනු අපරාධ වලට විෂ බීජය වූ මත්පැන් ඉතා අවදානම් සර්පයෙකි. "සිංහයා සහ පොළඟාත් පයින් පා ගනවා ඇත." (ගීතාවලිය 91:13) සර්පයා ගැන කථා කරන්නට ඇත්තේ එකම එක හොඳක් පමණයි. ඌ ප්‍රඥාගෝචරව ක්‍රියා කිරීමයි. සර්පයා දුර්ජනය, කිපෙන සුළුය, වෛරය සඟවාගෙන හැසිරෙයි, සැඟවී සිටියි. ඔබ තුල සර්පයාට සමාන මේ අයහපත් තත්වය ඇත්නම් සැබවින්ම ඔබ ගැළවීම ලබා නැත. ස්වාර්ග රාජ්‍ය ඔබට අයිති නොවේ. උන්වහන්සේ තේජවත් දෙවන ඊම ඔබට හිතිය ගෙන දෙනවාට කිසිදු සැකයක් නැත.

## පාතලයේ සර්පයා

ක්‍රියා 28:3 හි මිලේච්ජයන්ගේ දූපතක් වූ මෙලිතයේදී ගිනි රශ්මිය විදීමේ අටියෙන් දර මිටියක් ගින්නට ලූ අතර එහි වුන් විශගෝර සර්පයෙකු විසින් පාවුල් තුමාට දෂ්ඨ කරනු ලැබිය. නමුත් පාවුල් එම සර්පයා ගින්නට ගසා දමා කිසිදු උපද්‍රවයකින් තොරව සිටියේය. අවදිව සිටින්න සර්පයාගේ පැටවුන් වුවත්, ලොකු වුන් වුවත් විෂ ඒකාකාරමය. ඔබේ වටිනා ජිවිතය හා අමරණීය ආත්මය දශ්ඨ කරන්නට සර්පයාට ඉඩ දෙන්න එපා! "මුළු ලෝකය රවටන්නා වන යක්ෂයාය. සාතන්යයි කියන ලද මහා සර්පයා නැමති ඒ පුරාණ සර්පයා පහතට හෙලනු ලැබුවේය. ඔහු පොළවට හෙළනු ලැබුවෝය. ඔහුගේ දූතයෝද ඔහු සමඟ හෙලනු ලැබුවෝය. එවිට අපගේ දෙවියන්වහන්සේගේ ගැලවීමද, බලයද, රාජ්‍යයද, තමන් ක්‍රිස්තුස්වහන්සේගේ ආණ්ඩු බලයද දැන් පැමිණුනේය......" (එළිදරව් 12:9-10)

**ප්‍රන්සිස් විජයසිංහ**

# දෙවියන්වහන්සේගේ ගෘහය.



සිය සෙනඟ මධ්‍යයෙහි දෙවියන්වහන්සේ වැඩ වාසය කිරීම පටන් ගැන්මේ සිටම උන්වහන්සේගේ අභිප්‍රාය ව තිබුණි. අදහස අප සමඟ ජීවත් වීමයි. පළමුවෙන්ම ඒදන්හි මනුෂ්‍යා සහ උන්වහන්සේ සහභාගිකම් පැවැත්වූ සේක. එම සහභාගිකම වෙන් වූයේ පාපය නිසා බව අපි දනිමු.

අද උන්වහන්සේ යේසුස්වහන්සේ කරුණාකොටගෙන මිදීම ලද ඇදහිලිවන්තයින් සමඟ වසනසේක. ස්වාමීන්වහන්සේ ඒදන් උයනෙහි ප්‍රථම මනුෂ්‍යයා සමඟ ජීවත් වීම මුලින්ම අපට පෙනේ. මූලික අදහස දෙවියන්වහන්සේගේ ගෘහයයි. එනම් දෙවියන්වහන්සේට මනුෂයයා හමුවන ස්ථානයය. (නික්මයාම 25:8 බලන්න.) "මා ඔවුන් අතරෙහි වාසය කරන පිණිස ඔව්හු මට ශුද්ධස්ථානයක් සාදත්වා."

පරණ ගිවිසුමෙහි දැක්වෙන මෙම අදහස අළුත් ගිවිසුමට ගෙන ගොස් ඇති අයුරු ඊඟට බලන්න. (2 කොරෙන්ති 6:16) "..... එසේම දෙවියන්වහන්සේ කථා කොට: "මම ඔවුන් අතරෙහි වාසය කරන්නෙමි, හැසිරෙන්නෙමි, මම ඔවුන්ගේ දෙවියන්වහන්සේව සිටින්නෙමි. ඔහුද මාගේ සෙනඟව සිටින්නෝයයි කී සේක." දෙවියන්වහන්සේගේ ප්‍රේමණීය අදහස එහි පෙනේ. එනම් ස්වකීය සෙනඟ සමඟ වසමින් කථා කරමින්, හැසිරෙමින් සිටීමයි. උන්වහන්සේගේ අභිප්‍රාය ඉෂ්ඨ කිරීම පිණිස එම අදහස වැදගත් වේ.

තවත් බලවේගයක් දෙවියන්වහන්සේගේ අදහස් නිෂ්ඵල කරන්නට ක්‍රියා කරයි. ශුද්ධ ලියවිලි අනුව එම බලවේගය සාතන් හෙවත් යක්ෂයාය. ඔහු දෙවියන්වහන්සේගේ ගෘහයට විරුද්ධව ක්‍රියා කරමින් බේද කරන්නට තැත් කරයි. දේව ගෘහයෙහි සෑම කොටසක්ම ක්‍රිස්තුස්වහන්සේව එළිදරව් කරයි. උන්වහන්සේව නොහඳුනන අයට දෙවියන්වහන්සේගේ ගෘහයට සහභාගි වන්නට නොහැක. යේසුස්වහන්සේ තුළ සිටින අයගෙන් පමණි දේවගෘහය සමන්විත වනුයේ. "නුඹලාත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කරුණාකොට ගෙන ...... ආත්මික ගෘහයක් කොට ජීවමාන ගල්මෙන් ගොඩනගනු ලබන්නෙහිය. (1 පේත්‍රුස් 2:5)"

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවමාන එළිදරව්වීම දෙවියන්වහන්සේගේ ගෘහයයි. එහෙත් සාතන් හෙවත් යක්ෂයා බොහෝ මාර්ග වලින් පැමිණෙන්ට බලයි. ආලෝකයෙහි දූතයෙක් ලෙස සතුරා එන විට හඳුනා ගැනීමට

නොහැකි වේ. දේවදූතයෙක් සේ පෙනුනත් දෙවියන්වහන්සේගේ ගෘහය ගොඩ නැගිමට බාධා කරනවා නම් දෙවියන්වහන්සේගෙන් නොවන බව අප හඳුනා ගත යුතුය. ආත්ම දිනාගැනිමේ සේවයෙන් අපට දේව ගෘහය ගොඩනග න්නට පුළුවන. අපි උන්වහන්සේගේ ගෘහය ගොඩ නැගිමේ කාර්යයෙහි නියැලි සිටිමු.

උත්පත්ති 28 අනුව සිය නිවසින් පළායන යාකොබ් රෑ බෝ වූයෙන්, එක්තරා ස්ථානයක නැවති ගලක් හිස යට තබාගෙන නිදා ගනි. දෙවියන්වහන්සේ වෙතින් පළායාමට නුපුළුවන. අපරාධ කාරයාගේ මාර්ගය දුෂ්කර කරදර සහිත එකක් බව යාකොබ් මුහුණ පෑ තත්වයෙන් පැහැදිළිය. ඔහුට රාත්‍රියේ එළිමහනේම නිදා ගැනිමට සිදු වේ. හිස තබන්ට තිබුනේ ගලක්. වැරදි මාර්ග වල යන විට මෙසේ කරදර වලට මුහුණ පෑමට සිදුවේ. (උත්පත්ති 28:11)

එහිදි ඔහුට දෙවියන්වහන්සේ හමුවිය. නින්දේදි ඔහු සිහිනයෙන් ස්වර්ගයට එසවූ ඉණිමඟක් දුටුවේය. ස්වර්ගය හා පොළව සම්බන්ධ කරන මෙම ඉණිමගෙන් අදහස් වන්නේ යේසුස්වහන්සේය. එනම් මනුෂ්‍යයා හා දෙවියන්වහන්සේ සම්බන්ධ කරමින්, එම පරතරය නැති කළා වූ ..... පිහිටි ඉණිමඟ යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. දුක්විදිම කුරුසියේ මරණය හා නැවත නැගිටීම මගින් උන්වහන්සේගේ සභාවේ අත්තිවාරම විය. එතුමන් එළිදරව් වූයේ දේව පුත්‍රයානන් වශයෙනි.

ශු. මතෙව් 16: 16-18 බලමු. "සිමොන් පේත්‍රුස් උත්තර දෙමින්, "ඔබ ක්‍රිස්තුස්වහන්සේය. ජිවමාන දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝයයි කිවේය. යේසුස්වහන්සේ උත්තර දෙමින් සිමොන් බාර්ජෝනා නුඹ ආශිර්වාද ලද්දෙක්ය. මක්නිසාද ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන්වහන්සේ මිස මාංශය හා රුධිරය මේක නුඹට එළිදරව් නොකළේය. මම නුඹට කියමි: නුඹ පේත්‍රුස්ය. තවද මේ පර්වතය පිට මාගේ සභාව ගොඩ නගන්නෙමි. පාතාලයේ දොරටු ඒක පරාජය නොකරන්නේය." ඒ සිමොන් පේත්‍රුස්ට යේසුස්වහන්සේ එළිදරව් වූ අන්දමය. සිමොන් යනු ඔහුගේ පෙර නමයි. ප්‍රේතුස් යන නාමය ඔහුට ලැබුනේ යේසුස්වහන්සේගෙන්ය. (යොහාන් 1:42) සිමොන් යන්නෙහි අර්ථය වැලිය. වැලි මත ගොඩ නැගිය නොහැක. යොහාන් 1 : 42 අනුව ඔහුට පේත්‍රුස් යන අළුත් නම ලැබේ. එහි අර්ථය ගල යන්නය. සභාව ගොඩනගන පර්වතය යේසුස්වහන්සේමය.

යාකොබ් දෙසට යලි හැරෙමු. (උත්පත්ති 28:16-47 බලමු) යාකොබ් අවදිව ස්වාමින්වහන්සේ එහි සිටින බවත්, එය දෙවියන්වහන්සේගේ ගෘහය බවත් පවසයි. ගොඩනැගිල්ලක් එහි නොවිය. නමුත් යාකොබ් පැවසුවේ එය දෙවියන්වහන්සේගේ ගෘහය බවයි. එනම් දෙවියන්වහන්සේ මිනිසා සම්මුඛ වන සහ වාසය කරන ස්ථානයය.

තවත් කාරණයක් දෙස බලමු. "කොතරම් භයානක ස්ථානයක්ද?" දෙවියන්වහන්සේගේ එළිදරව් විම භය ගෙන දෙන්නෙකි. යාකොබ් දෙවියන්වහන්සේට බිය විය. අප තුළද දේව බිය තිබිය යුතුය. දේව භිය ඇති

කර ගන්න. දෙවියන්වහන්සේගේ මහත් බව හා ශුද්ධකම හිතට ගන්න. යෙසායා ස්වාමීන්වහන්සේ හමුවෙහි මැටි පිඩක් බව කිවේය. ක්‍රිස්තුස්වහන්සේ යොහාන්ට එළිදරව් වූ විට එතුමන් පා මුළ වැටී දෙවියන්වහන්සේට භය වීමෙන් අද ලබන මහත් ආශිර්වාද සම්භාරය දේව වචනයෙහි බොහෝ ස්ථාන වල සම්බවේ. ප්‍රඥාවේ පටන් ගැන්මද දේව භයයි. (හිතෝපදේශ 9:10)

අපගේ ගෞරවය ඉතා ඉහළින්ම දෙවියන්වහන්සේට පිදිය යුතුය. අප රටේ සංස්කෘතිය අනුව ගෞරවණීය අන්දමින් එතුමන් ඇමතිමට අපට පුළුවන. "ඔබ" යන්න නොකියා "ඔබ වහන්සේ" යනුවෙන් ඇමතිම ගෞරව සහිතයි. උසාවි වලදී විනිශ්චයකාරවරුන්ට ගෞරවයෙන් ඇමතිමට නිතිමය බලකිරීම වෙයි. එහෙත් අපි බල කිරීමක් නැතිව ප්‍රේමණීය දෙව්පියාණන්ට ගෞරව කරමු. වචනයෙන් පමණක් නොව ක්‍රියාවෙන්, හැසිරීමෙන්, ඇඳුම් පැලඳුම් වලින් ආදර්ශමත් ජිවිතයෙන් එතුමන්ට ගෞරව කරමු.

උදෑසන අවදිවන යාකොබ් හිසට තබාගත් ගල රැගෙන සිටුවා තෙල් ආලේප කර එම ස්ථානයට බෙතෙල් යන නම තබයි.: එහි අර්ථය දෙවියන්වහන්සේගේ ගෘහය යනුය. ඔහු නැවත එම ස්ථානයට එන බවද පොරොන්දු වෙයි. දෙවියන්වහන්සේ අපට හමුවන ස්ථානය දේව ගෘහය බව මෙයින් අපට පැහැදිළිවේ. එය ගොඩනැගිල්ලක් නොවේ. "මක්නිසාද දෙදෙනෙක් හෝ තුන්දෙනෙක් මාගේ නාමයෙන් යම් තැනක රැස්ව සිටිත් නම් මම එතන ඔවුන් මැද සිටිමි." (මතෙව් 18:20) යි යේසුස්වහන්සේ වදාල සේක.

යාකොබ් හාරාන් දෙසට භාර්‍යාවන් හා ගවයන් සොයමින් ගියේය. තමා ගැන පමණක් සොයමින් අවුරුදු 20ක් ඔහු ප්‍රයෝගයෙන් දියුණු විය. ලාබාන් නිසා ඔහුට කරදර විදීමට සිදුවූ නමුත් ප්‍රයෝග මාර්ගයෙන් ඔහු දියුණු විය. එහෙත් දෙවියන්වහන්සේගේ පැත්තෙන් බලන විට ඔහුට අසන්තොස වීම් විය. ඔහු පරාජයට ළංවිය. අන්තිමේදී ඔහු පළාගොස් දෙවියන්වහන්සේගේ වචනය කිකරුව බෙතෙල්ට ආපසු ගමන් ගත්තේය. ඒසව් නිසා යාකොබ් භයපත්ව සිටීමද, මුළු සිතින් දෙවියන්වහන්සේ වෙතට හැරීමට හේතුවක්ද විය. ඒ නිසා දෙවියන්වහන්සේම ඔහු බෙතෙල්ට ගෙනා සේක.

උත්පත්ති 32 හි දෙවියන්වහන්සේ යාකොබ්ට මුහුණට මුහුණ හමු වේ. ඔහු ස්වාමීන්වහන්සේ අත් නොහරින බවට ස්ථිර ප්‍රකාශයක් කරයි. (32:26) කලවා සන්ධිය කැඩුණමුත් ඔහු උන්වහන්සේ අත් නොහරියි. යාකොබ් ජය ගනී. (උත්පත්ති 32:28) යාකොබ් යන නමේ අර්ථය වංචාකරු යන්නයි. එහෙත් දෙවියන්වහන්සේගෙන් ඔහුට අළුත් නමක් ලැබේ. එනම් ඊශ්‍රායෙල් හෙවත් දෙවියන්වහන්සේ සමඟ පොර බඳන්නා යන තේරුමයි.

යාකොබ්ගේ කලවා සන්ධිය බිඳීම ගැන ඊළඟට මෙනෙහි කර බලන්න. තවත් ඔහුට පලායාමට බැරි විය. අපගේ මංශික ශක්තිය බිඳුනු තැන තමා දෙවියන්වහන්සේගේ බලය ක්‍රියා කරන්නේ. (උත්පත්ති 35: 1-4 බලන්න)

13 වෙනි පිටුව බලන්න......

# යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ජීවන දත්ත සටහන



⋆ සදාකාල අතීතයේදී යේසුස්වහන්සේ සිටි සේක. "පටන්ගැන්මේදී (සදාකාලයේදී) වාක්‍යාණෝ සිටි සේක." (යොහාන් 1:1)

⋆ පටන්ගැන්මේදී දෙවියන්වහන්සේ සමඟ සිටි සේක. "උන්වහන්සේ දෙවියන්වහන්සේ සමඟ සිටි සේක." (යොහාන් 1:2).

⋆ ලෝකයේ මැවීමේදී දෙවියන්වහන්සේ සමඟ සිටිසේක. "උන්වහන්සේ කරුණකොට ගෙන සියල්ල සාදන ලද්දේය." (යොහාන් 1:3).

⋆ මැවිල්ලට පළමුවෙන් උන්වහන්සේ සිටි සේක. (හිතෝපදේශ 8:22-30).

⋆ දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් හා දෙවියන්වහන්සේට සමානව ස්වර්ග යේ වැඩ වුන් සේක. "උන්වහන්සේ දෙවියන්වහන්සේගේ රූපාකාරය දරණ සේක් දෙවියන්වහන්සේට සමානව සිටීම..... (පිලිප්පි 2:6).

⋆ පවුකාරයන් ගලවා ගැනීම උදෙසා පොළවට පැමිණීමට ස්වකැමැත්තෙන්ම ස්වර්ගයෙහි පැවති සාකච්ඡාවේදී තීරණය කළ සේක. "අප උදෙසා යන්නේ කවුදැයි කියන්නාවූ ස්වාමීන්වහන්සේගේ හඬ මට ඇසුනේය. මමද: මෙන්න මම මෙහිය: මම යැවුව මැනවයි කීමි (යෙසායා 6:9).

⋆ තම මැවිල්ලක් වූ මරියා නම් කන්‍යාවගේ ගර්භාශය තුල ශුද්ධාත්මයානන්වහන්සේ කරුණකොටගෙන පිළිසිඳ ගත් සේක. "මරියා ශුද්ධාත්මයාණන් කරුණකොට ගෙන අද ගර්භණී වූ බව දැනගන්නා ලදී" (මතෙව් 1:18) (ලූක් 1:26-37).

⋆ ඊශ්‍රායෙල් රටේ බෙත්ලෙහෙම් නුවර ගව මඩුවක ළදරුවකු ලෙස මෙලොව බිහි විය. "ඈය කුළුදුල් පුත්‍රයා වදා රෙදි වලින් ඔතා, නවාතැන්ගෙයි ඔවුන්ට ඉඩ නොතිබුණු බැවින් ගවයින් කන ඔරුවක බෑ වූවාය. (ලූක් 2:7).

⋆ ව්‍යවස්ථාවේ ප්‍රකාරයට යෙරුසෙලමේ දේව මාළිගා වේදී දෙවියන්වහන්සේට දරුවෙකු ලෙස කැප කරන ලදී. (ලූක් 2:22-24).

⋆ වයස අවුරුදු 30 දක්වා මරියා හා යොසප් යටතේ නාසරෙත් නුවර හැදී වැඩුණු සේක. "යේසුස්වහන්සේ ප්‍රඥාවෙන් හා උස මහතින්ද දෙවියන්වහන්සේගේත් මනුෂ්‍යයන්ගේත් කරුණාවෙහිද වැඩුණු සේක. (ලූක් 2:52).

⋆ යොර්දාන් ගඟේදී යොහාන් බෞතිස්තගෙන් වතුර බෞතිස්මය ලැබූ සේක. (මතෙව් 3:13-17) (ලූක් 3:21-23).

⋆ පසුතැවිලි වෙයල්ලා මක්නිසාද ස්වර්ග රාජ්‍ය ලං වී තිබේ යැයි දේශනා කිරීම පටන් ගැනිම හා ඊශ්‍රායෙල් රට පුරා දේශනා කරමින් ගමන් කිරීම. (මතෙව් 04:17).

⋆ අවුරුදු තුනහාමාරක් දේශනා කරමින් ලෙඩුන් සුව කරමින් හා විවිධ හාස්කම් කරමින් ඊශ්‍රායෙල් දේශයේ ගම් නියම් ගම් හරහා ගමන් කළ සේක. (මතෙව්, මාර්ක්, ලූක්, යොහාන්).

⋆ උන්වහන්සේට ගොලයෝ 12 දෙනෙකු සිටියේය. (ලූක් 6:12-19).

⋆ රෝම ආණ්ඩුව විසින් අපරාධකාරයෙකු ලෙස කුරුසියේ තබා ඇණ ගසන ලදී. එම කුරුසිය මතදී උන්වහන්සේ මරණයට පත් විය. (ලූක් 23:33-40).

⋆ උන්වහන්සේගේ මෘත ශරීරය සොහොන් ගෙයක තබන ලදී - (ලූක් 23:50-53).

⋆ දින තුනකට පසු එම සොහොන් ගෙය තුල එම මෘත දේහය දක්නට නොලැබිනි. (ලූක් 24:1-3).

⋆ නමුත් පසුව උන්වහන්සේට ප්‍රේම කළා වූ අයට උන්වහන්සේ විවිධ අවස්ථා වලදී පෙනී දර්ශනය විය. (මතෙව් 28:9) (යොහාන් 14:32) (12:2).

⋆ යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටුණු බව ස්වාමින්වහන්සේගේ දූතයා විසින් ප්‍රකාශ කරන ලදී. (මතෙව් 28:1-8).

⋆ මළවුන්ගෙන් නැගිටුණු පසු දින 40 ක් පොලවේ ගත කොට සමූහයා බලා සිටියදී ස්වර්ගයට ඔසවා ගන්නා ලදී. (ක්‍රියා 1:1-9).

# යේසුස්වහන්සේගේ අනාගත සැළසුම.

⋆ මේ පොළොවේ උන්වහන්සේ අදහාගෙන සිට මරණයට පත් වූ අය සහ අදහා ජීවත්ව සිටින අය ස්වර්ගයට ගෙන යාම සඳහා වළාකුළු මතට පැමිණීම. (1තේසලෝනික 4:13-17).

⋆ පොළොව විනිශ්චය කිරීම - පීඩාකාලය ලෙස හඳුන්වයි. (එළිදරව් 6, 18 පරිච්ජේද).

⋆ උන්වහන්සේට විරුද්ධව සිටින සියලු සතුරන්ගෙන් ජය ගැනිම. (එළිදරව් 19:11-21).

⋆ සාතන් නොහොත් යක්‍ෂයා අවුරුදු දහසකට හිර කිරීම (එළිදරව් 20:1-3).

⋆ නැවත උන්වහන්සේ මේ පොළොව මතට පැමිණ පොළොවේ මහා රජ ලෙස යෙරුසලමේ සිට අවුරුදු දහසක් රජකම් කිරීම. (එළිදරව් 20:6)

⋆ අවුරුදු දහසක් නිමා වූ පසු සාතන් හා ඔහුගේ දූත සේනාව සදාකාලයටම විනාශ කිරීම - (එළිදරව් 20:7-10)

⋆ ඉන් පසු පරණ අහස පොළොව පහ කර අළුත් අහසත් පොළොවත් මැවීම. (එළිදරව් 21:1-2)

⋆ දෙවියන්වහන්සේගේ සදාකල් රාජ්‍ය ඒ පොළොව මත පිහිටු වීම. (එළිදරව් 21 හා 22)

**ගුරුහරු**

10 වෙනි පිටුවෙන්......

“දෙවියන්වහන්සේ යාකොබ්ට කථා කොට නැගිට බෙතෙල්ට ගොස් එහි වාසය කරපන්න. නුඹේ සහෝදර ඒසව් ඉදිරියෙන් නුඹ පලා ගිය කල්හි නුඹට පෙනුන දෙවියන්වහන්සේට එහි පූජාසනයක් සාදන්නැයි කී සේක. එවිට යාකොබ් තමාගේ පවුලටත් තමා සමඟ සිටි සියල්ලන්ටත් කථා කොට, නුඹලා අතරෙහි ඇත්තා වූ අන් දෙවිවරුන් පහකර දමා පවිත්‍රවී නුඹලාගේ වස්ත්‍ර මාරු කරපල්ලා. නැගිට බෙතෙල්ට යමු. මාගේ විපත්ති දවසෙහි මට උත්තර දුන්නාවූ මාගේ මාර්ගයේදී මා සමඟ සිටියා වූ දෙවියන්වහන්සේට එහි පූජාසනයක් සාදන්නෙමියි කිය. එවිට ඔහු තමන් අත තිබූ සියලු අන් දෙවිවරුන් සහ තමන්ගේ කන් වල තිබූ ආභරණද යාකොබ්ට දුන්නෝය. යාකොබ් ශේඛෙම් ළඟ තිබූ ආලෝන ගස යට ඒවා සඟවා තැබුවේය. ඔහු ගමන් කළෝය.

අද අප ළඟ දේවතා රූප නැති වුවත් අපේ සිත්වල අන් දෙවි වරුන් සිටින්නට පුළුවන. අපේ අන් දෙවිවරුනම් ස්වාමීන්වහන්සේට වඩා අප ප්‍රේම කරන සියල්ලයි. දෙවනුව අප යේසුස්වහන්සේගේ ලේ වලින් පවිත්‍රව සිටිය යුතුය. තුන් වෙනුව අප වස්ත්‍ර මාරු කර ගත යුතුය. එනම් අපේ ජීවිතය යේසුස්වහන්සේගේ ආත්මික ස්වරූපයට මාරු විය යුතුය. එසේම අපේ ඇඳුම් පැළඳුම් පවා දේව දරුවන්ට ඔබිනා ලෙස විය යුතුය. කාන්තාවක් නම්, පිරිමි ඇඳුම් නොඇඳිය යුතු බවද, පිරිමියෙකු නම් ගැහැණු ඇඳුම් නොඇඳිය යුතු බවද ද්විතිය කථාව 22:05 හි දැක්වේ. එය දෙවියන්වහන්සේට පිළිකුලක්ය. සිව් වැනිය අපි නැගිටිය යුතුයි. අලසව සැතපී සිටීමෙන් අපට දේව ගෘහය ගොඩ නැගීමට නොහැකියි. අපි නැගිට බෙතෙල්ට එනම් දේවගෘහයට යමු. (උත්පත්ති 35:04 හි) යාකොබ් ඉල්ලීම ඔහුගේ පවුලේ අයද අන් අයද ඉටු කරන අන්දම ඉතා අගනේය. අන් දෙවිවරුවන්ව පමණක් නොව, කනකර ආභරණද ගලවා ඔහු යාකොබ් අතට දුන්නේය. ඒවාට කුමක් සිදුවීද? ශෙකෙම් ළඟ ආලෝන ගස යට ඒවා වළලනු ලැබුවේය. ඔහු ශෙකෙම්ට ගියා සේ අපි කුරුසිය ළඟට යමු. දෙවියන්වහන්සේගේ ගෘහයට බාධාවන දේවල් වළලමු. මන්ද ඒවා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ .... එළිදරව් කරන සභාව අඩු කරන නිසයි. යාකොබ් දෙවියන්වහන්සේට භය විය. උත්පත්ති 35:05 අනුව අවට සියළු නුවරවල් කෙරෙහි මේ ඉශ්‍රායෙල් සෙනඟට විරුද්ධ වීමට භයක් පැමිණුනේය. අපි සැම දෙනාම දේව භයෙන් ගෞරවයෙන් දේව ගෘහය ගොඩ නැඟීමට යාච්ඤාවෙන් පොර බඳිමින් නැඟී සිටිමු

ගුරුහරු.



# සොලවන්ට බැරි රාජ්‍යයක්

අපගේ ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මේ පොළව මත ප්‍රසිද්ධියේ ඉගැන්වූ අවුරුදු තුනහමාර තුලදී වැඩිම වාර ගණනක් උන්වහන්සේගේ මුඛයෙන් නික්මුණු වචනය කුමක්දැයි ඔබ දන්නවාද? සුභාරංචි පොත් හතර කියවා බැලූවිට උන්වහන්සේ නැවත නැවත සමහර වචන ප්‍රකාශ කරනු බවට අපට පෙනේ ඒ අතුරින් වඩාත් කැපි පෙනෙන එකක් නම් "රාජ්‍යය යන වචනයයි"උන්වහන්සේ තම ප්‍රසිද්ධ සේවය ආරම්භ කළේද "කාලය සම්පූර්ණ විය දෙවියන්වහන්සේගේ රාජ්‍ය සමීපය" කියා දේශනා කරමිනි. උන්වහන්සේ දිනක් කඳු ගැටයක් මත සිටිමින් මෙම රාජ්‍යයට අයත් පාලන නීති ගැන දේශනා කළ සේක. (මතෙව් 5:7) උන්වහන්සේ උපමා කථා 29 කින් ඉගැන්වූ අතර ඉන් 13ක් පමණ මේ "රාජ්‍යය" ගැනයි. ශු.මතෙව් 13 වන පරිච්ජේදයේ ඇති උපමා කථා 07ක් ම මෙම රාජ්‍ය ගැනයි. යේසුස්වහන්සේ කුරුසියේ ඇණ ගැසීමට පෙර උන්වහන්සේ පිලාත් ඉදිරිපිටදී මෙම රාජ්‍ය ගැන කථා කළ සේක. (යොහාන් 18:26) ඒවාගේම ක්‍රියා 1:3 වන පදයට අනුව උන්වහන්සේ මළවුන්ගෙ 'න් නැගිට්ටායින් පසු ස්වර්ගයට පෙනෙමින් දෙවියන්වහන්සේගේ රාජ්‍ය ගැන කාරණා කිවූ සේක. මෙසේ බොහෝ වාර ගණනක් උන්වහන්සේ කථා කළා වූ මේ රාජ්‍ය ගැන ඔබ දන්නේ මොනවාද? ඔබ අද මෙම රාජ්‍යය තුළද? නැත්නම් ඉන් පිටතද?

## මතු පැමිණෙන රාජ්‍ය

උන්වහන්සේ දේශනා කළ මෙම රාජ්‍යය ප්‍රධාන ලෙස ස්වරූපයන් දෙකකින් යුක්තයි. පළමු එක නම් මෙම පොළොව මත පිහිටුවනු ලබන මතු පැමිණෙන්නට තිබෙන දෙවියන්වහන්සේගේ රාජ්‍යයයි. අද ලෝකයේ බොහෝ රාජ්‍යවල් තිබේ. එහෙත් ඉතා නුදුරු අනාගතයේදී මුළු පොළොවම එකම රාජ්‍යයක් යටතට එනම්, දෙවියන්වහන්සේගේ රාජ්‍යය යටතට පැමිණෙනවා ඇත. දෙවියන්වහන්සේගේ වචනයේ එලිදරව් කරන පරිදි "මහා පීඩා කාලය" අවසානයේදී ස්වාමි

වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේම නැවත පොළොවට පැමිණ දෙවියන්වහන්සේගේ රාජ්‍ය පොළොව මත පිහිටුවනවා .... එය සැබෑ ධර්මිෂ්ඨ රාජ්‍යයකි. එහි යේසුස් ක්‍රිස්තුස්වහන්සේ රජකම් කරන්නේ තනිව නොවේ. දැන් මේ කාලයේ උන්වහන්සේ නිසා දුක් විඳින්නාවූ අය, පීඩා ඉවසන අය එම දවසේදී උන්වහන්සේ සමඟ රජකම් කරති. (2 තිමෝති 2:12)

## දැන් පවතින දෙවියන්වහන්සේගෙ රාජ්‍ය.

අප ඉහත බැලුවේ පැමිණෙන්ට තිබෙන රාජ්‍යය ගැනයි. එහෙත් දැනුත් උන්වහන්සේ රාජ්‍යය පොළොවේ තිබෙන බව දන්නවාද? හැබැයි එය ආත්මික රාජ්‍යයක්. එය පිහිටුවා තිබෙන්නේ මුළු පොළොව මත නොව දෙවියන්වහන්සේගේ හා සමඟිව සිටින මනුෂ්‍යයින්ගේ සිත් වලයි. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට තමන්ගේ සිතේ රජ්ජුරුවන් කරගත් සෑම දෙනම මෙම රාජ්‍යයට ඇතුලත්ව සිටිති. සෑම ජාතියක්ම, භාෂාවක්ම මනුෂ්‍යයෝ අයත්ව සිටිති. මේ මම කථා කරන දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ ගුණාංග ඉතා අපූර්ව ඒවායි. “දෙවියන්වහන්සේගේ රාජ්‍ය යනු කෑමත් බීමත් නොව ධර්මිෂ්ඨකම ද, සමාදානයද, ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ ප්‍රීතියද වේ” රෝම 14:17 දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ ලක්‍ෂණ ඔබ දුටුවාද? ධර්මිෂ්ඨකමද, සමාදානයද? ශුද්ධාත්මයාණන්වහන්සේ තුල ප්‍රීතියද වේ. ඔබ මෙම රාජ්‍යට අයිතිනම් මේ ලක්‍ෂණ ඔබටත් අයිතිවිය යුතුය.

## ධර්මිෂ්ඨකම

දෙවියන්වහන්සේගේ වචනය ධර්මිෂ්ඨකම් දෙකක් ගැන කථා කරයි. එකක් නම් තමාගේ ම ධර්මිෂ්ඨකමයි. ඔවුන් තමන් පව්කාරයන් බව පිළිගන්න කැමති නැහැ. “මම හරි කෙළින් මනුෂ්‍යයෙක්. මම හරි අවංක මනුෂ්‍යයෙක්” වැනි කිම් අප නිතරම අසා තිබේ. ඔවුහු නිතරම “තමාගේ ධර්මිෂ්ඨකම ගැන” උදම් අනති. එහෙත් “ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙක් නැත. එක්කෙනෙක්වත් නැත.” “සියල්ලෝම පව්කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති” (රෝම 3:23) එය දෙවියන්වහන්සේගේ වචනයයි. මේ පොළොව මත කිසි

මනුෂ්‍යයෙකුට තමන්ගේම පුළුවන් කමින් ධර්මිෂ්ඨ විය නොහැක. සමහර පුද්ගලයින් බොහෝ ධර්මිෂ්ඨ ලෙස අපට පෙනෙන්නට පුළුවන්. නමුත් දෙවියන්වහන්සේ බලන්නේ ඇතුළාන්ත ශුද්ධකමයි. හැම මනුෂ්‍යයෙකුම උපතින්ම පව්කාර ස්වභාවය උරුමකර ගත්තෝ වෙති. මේ ධර්මිෂ්ඨකම උපයා ගැනීමට ලෝකයේ කිසිම මනුෂ්‍යයෙකුට නුපුළුවන එහෙත් යමෙක් තමාගේ පාපය ගැන පසුතැවිලි වී යේසුස්වහන්සේ එම පාපය වෙනුවට කුරුසිය මත පූජා වුණු බව මුළු සිතින් අදහා උන්වහන්සේම තමාගේ සිතට පිළිග න්නේනම් මෙම දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ඔහු වෙතට දමනු ලබයි. යේසුස්වහන්සේගේ ජීවිත පූජාව ඔබ ජීවිතයට පිළිගැනීම නිසා ඔබ දෙවියන්වහන්සේගේ ඉදිරියේ ධර්මිෂ්ඨව සිටී. අප තුළ වැඩ වසන යේසුස්වහන්සේම අපගේ ධර්මිෂ්ඨකම වන බව 1 කොරින්ති 1:30 හෙළි කරයි. මෙම ආකාරයෙන් ලැබෙන දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ඔබ ලැබ තිබෙනවාද? එසේනම් පමණයි ඔබ දෙවියන්වහන්සේගේ රාජ්‍යයට අයිතිවන්නේ.

# සමාදානය.

සමාදානයන් හතරක් ගැන බයිබලයේ කතාකරයි. පළමුවෙන්ම "දෙවියන්වහන්සේ හා සමග සමාදානය" ඇතුව සිටීමයි. බයිබලය කියවනවා අපි අපගේ පාපවල සිටින විට එනම්, යේසුස්වහන්සේව හැඳින ගැනීමට පෙර දෙවියන්වහන්සේගේ සතුරන්ව සිටිනවාය කියා. එහෙත් අපි සතුරන්ව සිටිය දීම යේසුස්වහන්සේ අප වෙනුවට මරණයට පත් වීම කරණ කොට ගෙන අපි දෙවියන්වහන්සේ හා සමාදානය ලබාගෙන නැද්ද? එසේනම් අපි දෙවියන්වහන්සේ හා සමගි වෙයල්ලා යැයි බයිබලය පවසයි. දෙවියන්වහන්සේ හා සමඟ සමාදාන වී සිටින සැම දෙනම දෙවියන්වහන්සේගේ සමාදානය අත්දැක තිබේ. එය කිසි නුවනකින් දැනගත නොහැකි සමාදානයකි. (පිලිප්පි 4:7) මේ සමාදානය ඇති මනුෂ්‍යයා මරණය ඉදිරියේ පවා නොසැළෙයි. මක්නිසාද, ඔහුට එය ස්වර්ග දොරටුවයි.

මීළගට මනුෂ්‍යයින් සමඟ සමාදානය ඇතුව සිටීම බයිබලයේ කථා කරයි. (1 තෙසලොනික 5:13)

අවසාන වශයෙන් හතර වෙනුව බයිබලයේ සඳහන්වහන්නේ "බොරු සමාදානය ගැනයි" (එසකියල් 13:10) අද අපි තුල මෙම බොරු සමාදානය සියලු ආගම් තුළ දක්නට පුලුවන් ඉතා ගැඹුරු ලෙස යම් ආගමක් අනුග මනය කරන්නා එමගින් ඔහු සමාදානය අත් කරගෙන සිටින බවක් අගවන්නට උත්සහ කරයි. නමුත් එය කිසිලෙසකින්වත් සැබෑ සමාදානයක් නොවේ. මරණයේ දොරකඩදී, යක්ෂයාගේ බලය තමාගේ ආත්මය කෙරෙහි ක්‍රියා කිරීමට පටන්ගත්විට මේ සමාදානය සුනු විසුණු වී යයි. ප්‍රිය මිත්‍රය ඔබ මේ බොරු සමාදානයෙන් මිදී ඔබගේ පාපකාරී ස්වභාවය තේරුම්ගෙන යේසුස්වහන්සේ කරණකොට ගෙන දෙවියන්වහන්සේ හා සමග සමාදානය වී ඇතැයි අපි සිතමු. එසේ නම් පමණක් ඔබ දෙවියන්වහන්සේගේ රාජ්‍යට ඇතුල් වී සිටී.

## ශුද්ධාත්මයානන් තුළ ප්‍රීතිය.

දෙවියන්වහන්සේ රාජ්‍යයේ තුන්වෙනි ලක්‍ෂණය මෙයයි. අද ලෝකයේ බොහෝ මනුෂ්‍යයින් ප්‍රීති සන්තෝෂය වෙති. යමෙක් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තමාගේ සිතට පිළිගැනීමේදී ශුද්ධාත්මයාණන්වහන්සේ සිතට ඇතුල්වන සේක. මේ නිසා එතැන් පටන් මේ ශුද්ධාත්ම ප්‍රීතිය අත්දැකීමට පුලුවන. ඔබට කෑම නැතිවෙන්න පුළුවන්. එසේ නැත්නම් මුදල් හෝ ඇඳුම් නැතිවෙන්න පුළුවන්. නමුත් මේ ශුද්ධාත්මයාණන් තුල ප්‍රීතිය එක බිඳකින්වත් අඩු කරන්න, ඒවාට බැහැ, ඒ තේජසින් පූර්ණ වූ මහත් ප්‍රීතියකි (1 ප්‍රේත්‍රුස් 1:9)

ඉහත අපි බලාගන්නා වූ ධර්මිෂ්ඨකමත්, සමාදානයත්, ප්‍රීතියත් ලබන පිණිස ඔබගේ සියළු පාප ගැන පසුතැවිලි වී යේසුස් ක්‍රිස්තුස්වහන්සේ වෙතට එන මෙන් මම ඔබට ආරාධනා කරමි එසේ කරන්නට දෙවියන්වහන්සේ ඔබට පුළුවන් කම දෙන සේක.

- පීවන හඬ -

# ගැලවීම නොහොත් නැවත ඉපදීම ලැබූ පුද්ගලයෙකු යනු කවුද?

01 දෙවියන්වහන්සේගේ ආත්මයෙන් ඉපදී සිටින කෙනෙක් ය. (යොහාන් 3:8)

02 දෙවියන්වහන්සේ වචනයෙන් ඉපදී සිටින කෙනෙක්. (1 පේත්‍රුස් 1:23)

03. ස්වාමී වූ යේසුස්වහන්සේ තමන්ගේ ගැලවුම්කාරයා හා ස්වාමීන්වහන්සේ ලෙස පිලිගෙන අදහාගත් කෙනෙක්ය. (ක්‍රියා 16:31), (යොහාන් 1:12)

එනම් උන්වහන්සේගේ - දේවත්වය, කුරුසි පූජාව, නැවත නැගිටීම, මනුෂ්‍යත්වය, සුවකිරීම, බලය, සභාවේ හිස, සියල්ල ප්‍රධාන, නැවත නැගිටීම රජකම් කිරීම, විනිශ්චය යන ආදී බයිබලයේ සඳහන් සියල්ල පිළිගෙන විශ්වාස කළ යුතුය.

04. දෙවියන්වහන්සේ පුත්‍රයාණන් තමා තුල ඇති කෙනෙක්ය (යොහාන් 5:12)

05 ශුද්ධාත්මයාණන්වහන්සේ විසින් මුද්‍රාකල කෙනෙක්ය. (එපිස 1:14) (එපිස 4:30)

එනම් තමා දෙවියන්වහන්සේට අයිති කෙනෙකු බවත්, එම අයිතිය කිසිදා නැති නොවන බවටත් විශ්වාස කළ යුතුය.

06 ශුද්ධාත්මයාණන් විසින් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය හා මරණය තුලට බෞතිස්ම කල හා ශුද්ධාත්ත්යාණන්වහන්සේගෙන් මවනු ලැබූ කෙනෙකි. එනම් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ අවයවයන් බවට පත් වූ අයෙකි. (1කොරෙන්ති 12:13)

07 ලෝකයේ අත්තිවාරම දැමීමට පෙර ක්‍රිස්තුස්වහන්සේ විසින් තොරාගත් කෙනෙකි. (එපිස 1:3,4)

08 ඇදහිල්ලෙන් ධර්මිෂ්ඨ කරනු ලැබූ කෙනෙකි. (රෝම 5:1) (රෝම 5:8)

09. තමා තුල ශුද්ධාත්මයාණන්වහන්සේ වැඩ සිටින කෙනෙකි. (1 කොරෙන්ති 6:19,20)

10. දෙවියන්වහන්සේගේ අනුග්‍රහයෙන් දෙවියන්වහන්සේ දීමනා ලැබූ කෙනෙකි. (එපිස 2:5)

ගුරුහරු

# රොටි කැඩීමේ මෙහෙය

මෙම ආත්මික කාරණය යේසුස්වහන්සේ විසින් තම ගෝලයන්ට භාර දුන් දෙයකි. ලූක් 19:20හි සඳහන් වන්නේ එම ආරම්භක අවස්ථාවයි. ඉන් පසු උන්වහන්සේ අදහන අය රැස් වන අවස්ථාවලදී මෙම දෙය ආත්මික අර්ථයෙන් කළ බව බයිබලයේ සඳහන් වේ. (ක්‍රියා 2:42) (ක්‍රියා 2:46) (ක්‍රියා 28:07)

01. රොටි කැඩීම ඇදහිලිවන්තයන්ට නැතිවම බැරි දෙයකි - ( 1 කොරෙන්ති 11:23)

පාවුල්තුමා යේසුස්වහන්සේගේ ගොලයන් 12 අයිති නැත. නුමුත් යේසුස්වහන්සේ පාවුල්ට විශේෂ ආකාරයෙන් එළිදරව් වී මෙම අණය දුන් සේක.

02. යේසුස්වහන්සේ සිහි කරන සෑම තැනම රොටි කැඩීම කළ යුතුය. - (1 කොරෙන්ති 11:24,25)

සමහර ඇදහිලිවන්තයන් මෙය ඉටු නොකරයි නැතිනම් මසකට කවරක් හෝ විශේෂ අවස්ථා වල සිදුකරයි.

03. රොටි කැඩීම තුලින් යේසුස්වහන්සේගේ මරණය ප්‍රකාශ කරයි. - (1 කොරෙන්ති 11:24-25) අපගේ ජිවන රටාව තුලින් එනම් ශුද්ධ ජිවිතයක් ගත කිරීම තුලින් උන්වහන්සේගේ මරණය පෙන්වයි.

04. රොටි කැඩීම තුලින් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සිහි කරන ඇදහිලි වන්තයා උන්වහසන්සේගේ ශරීරය හා ලේ සිහි කිරීම හා එයට සහභාගි වීම මගින් උන්වහන්සේ සමග අභිරහස්මය සම්බන්ධතාවයකට ඇතුල් වේ. - (1 කොරෙන්ති 10:10)

05. රොටි කැඩීම වැඩි වාර ගණනක් කිරීම යෝග්‍යය. (1 කොරෙන්ති 11:25)

06. රොටි කැඩීම මගින් ඇදහිලිවන්තයන්ගේ එක ශරීරයේ ඇදහිලිවන්තයන් බව ඒත්තු ගැනිම හා ඇදහිලිවන්තයන්ගේ ඒකත්වය පෙන්නුම් කරයි ( 1 කොරෙන්ති 10:17)

07 රොටි කැඩීම මගින් යේසුස්වහන්සේගේ දෙවැනි පැමිණීම නොහොත් සභාව ඔසවා ගැනිම සිහි කරයි. එනම් දෙවැනි පැමිණීමේ බලාපොරොත්තුව අළුත් කිරීම හා මතක් කිරීම සිදු කරයි.

**-බයිබලයේ අධ්‍යනයක් ඇසුරැණි-**

# අසාමාන්‍ය උපත

දරුවකු පිළිසිඳ ගැනිමට නම් පුරුෂයකු හා ස්ත්‍රියක් ලිංගිකව එක්වීම අවශ්‍යය. එය රහසික් නොවේ. නමුත් බයිබලයේ සඳහන් වන යේසුස්වහන්සේගේ උපතට පුරුෂයා සම්බන්ධ නොවේ. එනම් යේසුස්වහන්සේට මනුෂ්‍ය පියෙකු නොසිටියේය. බයිබලයේ සඳහන් වන ඊසාක් හා යොහාන් බෞතිස්තගේ පිළිසිඳ ගැනිමට දේවානුභාවය හා ශුද්ධාත්මයාණන් කරණ කොට ගෙන පිළිසිඳගත් මුත් ඔවුන් මෙලොව පියවරු සිටියහ. (උත්පත්ති 18: 10-14) (ලූක් 1:5-19).

යේසුස්වහන්සේ උපත ලබන්නට පෙර මරියා කිසිම පුරුෂයෙකු සමඟ ශාරීරිකව සම්බන්ධ වී තිබුනේ නැත. මරියාගේ කුස තුල යේසුස්වහන්සේ පිළිසිඳ ගන්නා විට ඇ කන්‍යාවකුව සිටියාය. යේසුස්වහන්සේ පිළිසිඳ ගනු ලැබුවේ ශුද්ධාත්මයාණන් කරණ කොට ගෙනය. (ලූක් 1 : 26-34) මේ වන විට මරියා යෝසෙප් නම් තරුණයෙකුට විවාහ බස් දී තිබුණි.

මරියාට දරුවකු ලැබිමට සිටින බව ඔහු දැනගත් කල් හි, මරියා කාමමිථ්‍යාචාරය යෙදී ඇති බව යොසප් සිතන්නට ඇත. මක්නිසාද විවාහ වී හෝ විවාහ බස් දී සිටිය දී විශ්වාසය කඩ කල විට එය හඳුන්වන්නේ කාමමිථ්‍යය ලෙසය. නමුත් යොසප් ධර්මිෂ්ඨ මනුෂ්‍යය විය. මරියාට ප්‍රසිද්ධියේ නින්දා කිරීමට යෝසෙප් අකමැති විය. නමුත් ඔහුට අවශ්‍ය වූයේ එම විවාහ ගිවිසුමෙන් රහසිගතව ඉවත් වීමට හෝ මරියා අත්හැරීමට යෝසප් තිරනය කලේය. නමුත් හදිස්සියේම දේව දූතයෙක් දෙවියන්වහන්සේ වෙත යොසෙප් වෙත පැමිණියෙය. දේව දූතයා විසින් සියල්ල පැහැදිලි කර දුන්නේය. මරියා කාමමිථ්‍යාචාරය නොකල බවටත් ශුද්ධාත්මයාණන් වහන්සේ කරන කොට ගෙන මරියා ගර්භණී වී සිටිය බවටත්, ඉපදෙන දරුවා විශේෂ දරුවකු බවටත්, මරියා සරණ පාවා ගන්නා ලෙසටත් යෝසෙප් විසින් එත්තු ගනු ලැබූ පසු ඇය පාවා ගනු ලැබිය.

තවද දරුවාට යේසුස් යන නම තබන ලෙස දේවදූතයා යෝසෙප්ට කිවේය. එහි අර්ථය ස්වාමීන්වහන්සේ ගලවන සේක. එනම් යේසුස්වහන්සේ ජනතාවගේ ගැළවුම්කාරයාණන් වන්නේය. තම ජනයාට තම පාපවලින් උන්වහන්සේ ගලවන යන අර්ථය එහි ගැබ්ව තිබිණි.

රෝම 6:23 රෝම 3: 23, යොහාන් 3 : 16-17 යන පද සඳහන් වන පාපයේ භයානක ප්‍රතිඵලය සහ දෙවියන්වහන්සේ විසඳුම සහ අභිප්‍රාය එම බයිබල් පදවල සඳහන් වේ.

යෙසායා 7:14 හි සඳහන් එම්මානුවෙල් නමින්ද හඳුන්වයි.කද එහි අර්ථය දෙවියන්වහන්සේ අප සමඟය. යේසුස් නමින් මනුෂ්‍යයන් වන අප අතරරෙහි වාසය පිණිස පොළවට පැමියේ දෙවියන්වහන්සේමය. නත්තල නමින් සිහි කරන දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන්ගේ උපත ඓතිහාසික සිදු වීමකි. එය සත්‍ය වශයෙන් සිදු වුවකි. දෙසැම්බර් 25 දින සිදුවුවාද එසේ නැතිනම් වෙන දිනක සිදුවුවාද අප දන්නේ නැත. නමුත් එය ඒකාන්තයෙන්ම සිදු විය. මෙම අසාමාන්‍ය උපත අප අර්ථාන්විතව දේව ගරුභිය සහිතව භකිතිවන්ත ආකාරයෙන් දෙවියන්වහන්සේට හා යේසුස්වහන්සේට නමස්කාරය හා ගෞරවය හිමි වන ආකාරයට සිහි කිරීම උන්වහන්සේ අනුගාමිකයන් වන අපගේ වගකීමකි.

**ගුරුහරු.**

# අප යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අදහන්නේ ඇයි?

උන්වහන්සේ පාස්කු මංගල්‍යයේදි යෙරුසලමෙහි සිටි කල්හි බොහෝ දෙනෙක් උනවහන්සේගේ ලකුණු දැක උන්වහන්සේගේ නාමය කෙරෙහි අදහා ගත්තේය. (යොහාන් 2:25)

බොහෝ මනුෂ්‍යයන් යේසුස්ක්‍රිසිතුස් වහන්සේ අදහගත්තේ උන්වහන්සේ කළ බොහෝ ආශ්චර්යමත් ක්‍රියා හා හාස්කර්ම නිසාය. (යොහාන් 6:2) එසේ අදහගත් අයගේ ඇදහිල්ල ගැඹුරු නෙවිය. එහි පදනම බවට පත් වුයේ දෙවියන්වහන්සේගේ පුත්‍රයා යන සත්‍ය නොව හාස්කර්ම හා තම අවශ්‍යතාව ඉටු විමය. බොහෝ ජනයා යේසුස්වහන්සේ සැලකුවේ හාස්කර්ම කරන්නේකු හෝ නායකයකු හෝ රජ කෙනෙකු හැටියටය. නමුත් යේසුස්වහන්සේ යනු අහස පොළොව මවා පාලනය කරන දෙවියන්වහන්සේගේ පුත්‍රයා බව දැන ගැනිමට හෝ අවබෝධ කර ගැනිමට ආත්මික ඥානයක් නොතිබුණි. අද දවසේ උන්වහන්සේ අදහාගෙන හෙට දවසේ උන්වහන්සේ අමතක කර දමයි. ඔවුන්ගේ ඇදහිල්ල පදනම් වී තිබුනේ හාස්කර්ම මතය.

යේසුස්වහන්සේගේ උපත, මරණය, වැලලිම, මළවුන්ගෙන් නැවත නැගිටීම සිදු වී අවුරුදු 2000 ආසන්න කාලය රැත වී ඇත. එහෙත් වර්ථමාන බහුතර ඇදහිලිවන්තයන්ද ආත්මික නෙමේරූ බවකින් පෙලෙන බවයි. මගේ හැගිම් අදද හාස්කර්ම මත තම ඇදහිල්ල තබා යේසුස්වහන්සේ අනුගමනය කරන අ අයද සිටිති. යම් පුද්ගලික අවශ්‍යතාවයක් ඉටුවීම, අසනිපයක් සුව වීම, කරදර වලින් නිදහස් වීම වැනි දෑ යේසුස්වහන්සේගේ කරුණාව නිසා මනුෂ්‍යයන්මත අපට ලැබෙන ආශිර්වාදයි. එහෙත් උන්වහන්සේට එසේ කිරීමට හැකියාව ඇත්තේ උන්වහන්සේ කවුරු නිසාද?

## පුද්ගලික වාසී.

එවකට ජනතාව ප්‍රසංගා කරමින් යේසුස්වහන්සේ පසු පස පැමිණිය නමුත් යේසුස්වහන්සේ ඔවුන් ගැන කිවේ ඔවුන්ගේ ප්‍රශංසාව තොල් වලින් පැමිණි බවය. එම නිසා ජනතාවගේ ප්‍රශංසාව හෝ ඔවුන්ගේ ප්‍රසිද්ධිය ලබා ගැනිමට උත්සහ කලේ

නැත. ඔවුන් නායකයා වීමට උත්සහ කලේ නැත. මක්නිසාද, උන්වහන්සේ මෙලෙව පැමිණියේ පව්කරුවන් උදෙසා මේ ජිවිතය පූජා කිරීමටය.

අද දවසේ පවා බොහෝ උන්වහන්සේ පසුසේ ගමන් කරන්නේ පුද්ගලික වාසි උදෙසාය. උපකාරකයක් ලබා ගැනිම, රැකියාවක් ලබාගැනිම, අසනිපයට සුවය ලබා ගැනිමට, දරුවන්ට ශිෂ්‍යත්වයක් ලබා ගැනිමට නිවසක් ලබා ගැනිමට, පාසැලක් ලබා ගැනිමට වැනි හේතු නිසා විය හැකිය. මෙවැනි අය සලකන්නේ යේසුස්වහන්සේගෙන් ඔවුන්ට ලබා ගත හැකි දේ ගැන මිස යේසුස්වහන්සේට ඔවුන්ට දිය හැකි දේ ගැන නොවේ. තම අවශ්‍යතාවය ඉටු නොවූ පසු බිමක ඔවුන් යේසුස්වහන්සේගෙන්ද ඉවතට ගමන් කරයි. අවසානයේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නොමිලේ සැමට ප්‍රධානය කරන ගැලවීම බොහෝ සාදාකාල ජිවනයද ඔවුන්ට අහිමි වෙයි. එබැවින් අපත් අපගේ ජිවිතය හා ඇදහිල්ල සෝදිසි කර බලා අප තුළ යේසුස්වහන්සේ කෙරෙහි සැබෑ ඇදහිල්ල හා ප්‍රේමය තිබේදැයි බලමු.

## දෙවියන්වහන්සේගේ පුත්‍රයා.

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ යනු දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් බවත් උන්වහන්සේ මෙලොවට පැමිණියේ පාපයෙන් වන්දි මිලය ගෙවීමට බවත්, මනුෂ්‍ය සංහතියේ ගැළවුම්කාරයා බවත් ඇදහිල්ල සහතිකව විශ්වාස කිරිම තුලින් උන්වහන්සෙගේ සැබෑව විශ්වාස කිරිම තුලින් උන්වහන්සේ ගේ සැබෑ ආශිර්වාදය පාපයෙන් ගැලවීම නොහොත් ඔබේ සියලූ පාපවලට සමාව ලබා ගත හැක. මරණින් පසු සදාකාල ජිවනයට ඇතුල් වීමට වරම් ලැබෙනු ඇත. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ යනු අපගේ මෙලොව ජිවිතය පමණක් නොව සදාකාල ජිවිතයම සාර්ථක කර දෙන ස්වාමීන්වහන්සේ බව විශ්වාස කිරීමට තරම් ගැඹුරු ආත්මික අවබෝධයක් ශුද්ධාත්මයානන් වහන්සේට ඔබ ලබා දෙන සේක්වා.

## ජිවන හඩ

# ඔබ සැමට ලබන්නාවූ නව වසර දෙවියන්වහන්සේගේ කරුණාව, අනුග්‍රහය, සුවය හා ආශිර්වාද බහුල වූ ප්‍රීතිමත් නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමු.

- දිනපතා බයිබලය කියවීමට
- දිනපතා යාච්ඤා කිරීමට
- සෑම ඉරුදිනකම සභාවට පැමිණීමට
- තම ආදායමෙන් දෙවියන්වහන්සේට කොටසක් වෙන් කිරීමට
- එක් දිනකදී එක් අයකුටවත් යේසුස්වහන්සේ ගැන සාක්ෂි දැරීමට

2017 නව වසරේ අපි අධිෂ්ඨාන කර ගනිමු.

**ක්‍රිස්තියානි සහෝදර මධ්‍යස්ථානය**
අංක - 07, විවේකානන්ද පාර,
වැල්ලවත්ත,
කොළඹ 06.
දුරකථන අංක : 011 2581901
www.christianfellowshipcentre.com

**NMA GRAPHICS**
No. 246/A, Galle Road, Ratmalana.
Tel: 011 2 730 644 / 071 4 286 295 / 077 4 223 020
E-mail : nmagraphics2001@gmial.com